දෙපාර්තමේන්තු චක්‍රලේඛ:- 03/2013

මගේ අංකය:-DAPH/AB/4/4/1,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
ගැටඹේ,
පේරාදෙණිය.
2013-06-19

සියළුම පළාත් අධ්‍යක්ෂවරුන්,
දිස්ත්‍රික් පශු වෛද්‍ය නිළධාරීන්,
පශු වෛද්‍ය නිළධාරීන්,

වැස්සි පැටවු ඇති දැඩි කිරීමේ ව්‍යාපෘතිය-2013

වැස්සි පැටවු ඇති දැඩි කිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වූ මාගේ අංක AD/5/දෙපා.ච/2010/පොදු හා 05/2010 දෙපාර්තමේන්තු චක්‍රලේඛය මින් අවලංගු කරන අතර ඉදිරියේදී ඒ සඳහා මෙම චක්‍රලේඛණය බල පැවැත්වෙන බව දන්වමි.

මෙම නව ක්‍රමය යටතේ කෘත්‍රිම සිංචනයෙන් උපදින ලියාපදිංචි වැස්සි පැටවාගේ කාර්ය සාධනය අනුව ගෙවීම් කරන බැවින් ගොවි මහතා නිර්දේශිත වර්ධන තත්වයන් ලඟා කර ගැනීමට උත්සුක වනු ඇත.

2013 වසරේ සිට ඉහත ව්‍යාපෘතිය නව ක්‍රමවේදයකට අනුව දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. එබැවින් මධ්‍යම රජය මගින් ගොවීනට ලබා දුන් ද්‍රව්‍යමය යෙදවුම් තවදුරටත් ලබා දීමක් සිදු නොකරන අතර වාරික 04 ක් මගින් ගොවීනට මූල්‍ය ආධාර පහත සඳහන් අයුරු ලබා දීමට කැබිනට් අනුමැතිය ලැබී ඇත.

මුදල් ගෙවීමේ යෝජිත ක්‍රමය

වාරිකය	විස්තරය	මුදල රු. (ඉහළම කාර්ය සාධනය)	මුදල රු. (සාමාන්‍ය කාර්ය සාධනය)
1	කෘත්‍රිම සිංචනයෙන් උපදින වැස්සි පැටවා ලියාපදිංචි කිරීමේදී	2,000.00	2,000.00
2	ලියාපදිංචි වැස්සි පැටවාට වයස මාස 18ට පෙර කෘත්‍රිම සිංචනය කළ විට. (ඉහළම කාර්ය සාධනය)	3,000.00	
	ලියාපදිංචි වැස්සි පැටවාට වයස මාස 18 - 21 අතර කෘත්‍රිම සිංචනය කළ විට. (සාමාන්‍ය කාර්ය සාධනය)		1,500.00
3	ලියාපදිංචි වැස්සි පැටවා කෘත්‍රිම සිංචනය කර මාස 03ක් ඇතුළත ගැබ් ගත් බවට තහවුරු කිරීමෙන් පසු	2,000.00	2,000.00
4	ලියාපදිංචි වැස්සි පැටවාට වයස මාස 28 කට පෙර පැටවෙකු බිහි කළ විට	3,000.00	
	ලියපදිංචි වැස්සි පැටවාට වයස මාස 30 කට පෙර පැටවෙකු බිහි කළ විට		2000.00
	එකතුව	10,000.00	7,500.00

ගෙවීම නිර්දේශ කිරීම සඳහා ගොවීන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරුවල නිරවද්‍යතාවය අදාළ ශිල්පීන් සහ පශු වෛද්‍ය නිළධාරීන් විසින් තහවුරු කල යුතුය. එසේම නිර්දේශිත තත්වයන් ලඟා කර නොගන්නා සතුන් ව්‍යාපෘතියෙන් ඉවත් කර ඒ බව සත්‍ව අභිජනන අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතුය.

සත්ව සංවර්ධන උපදේශකවරුන් සඳහා

1. සුදුසු වැස්සි පැටවුන් හඳුනා ගෙන එකී පැටවුන් මසක් ඇතුලත ලියාපදිංචි කර කන් සලකුණු කිරීම
2. HCR-1 ඉල්ලුම් පත්‍රය පිටපත් දෙකකින් පුරවා එකක් පශු වෛද්‍ය කාර්යාලයේ ගොනු කර අනෙක් පිටපත දිස්ත්‍රික් පශු වෛද්‍ය නිළධාරි සහ පළාත් අධ්‍යක්ෂ මගින් ප්‍රධාන කාර්යාලයට යොමු කිරීම
3. මාස 03 කට වරක් වැස්සි පැටියා සහ ගොවිපොල පරීක්ෂා කර දී ඇති උපදෙස් පරිදි අදාළ වාර්තා ගොවි මහතා විසින් නඩත්තු කරනු ලබන බවට සෑහීමකට පත්විය යුතුය. නිරීක්ෂණය කරනු ලබන තොරතුරු ගොවි මහතා වෙත සපයා ඇති වාර්තා පොතෙහි (HCR-2) නියමිත පිටුවෙහි ඇතුලත් කළ යුතුය.
4. වැස්සි පැටියා වෙනුවෙන් වාරික 04කදී ගෙවීම කරනු ලබන බැවින් එම අවස්ථා හඳුනා ගෙන ගෙවීම් කටයුතු සඳහා ඉල්ලුම් කිරීම හා ගොවීන්ගෙන් පොදු 35 වවුචර්පත් අත්සන් කර දිස්ත්‍රික් පශු වෛද්‍ය නිළධාරි මඟින් පළාත් අධ්‍යක්ෂ වෙත යොමු කිරීම
5. මාසිකව අදාළ බල ප්‍රදේශයේ ප්‍රගතිය පශු වෛද්‍ය නිළධාරියාට වාර්තා කිරීම

පශු වෛද්‍ය නිළධාරි

1. අදාළ ශිල්පීන්ගේ කටයුතු අධීක්ෂණය කර උපදෙස් ලබා දීම
2. ගොවි මහතාට මුදල් ගෙවීමේදී පොදු 35 වවුචර්පත නිර්දේශ කිරීම
3. ව්‍යාපෘතියේ කටයුතු නිසි ලෙස පවත්වා ගැනීමට අදාළ අනෙකුත් වාර්තා පවත්වා ගැනීම
4. මාස 06කට වරක් හෝ මෙම ගොවිපොල පෞද්ගලිකව අධීක්ෂණය කිරීම

දිස්ත්‍රික් පශු වෛද්‍ය නිළධාරීන්

1. අදාළ ශිල්පීන්ගේ සහ නිළධාරීන්ගේ කටයුතු නිසි ලෙස අධීක්ෂණය කිරීම
2. දිස්ත්‍රික්කයේ ප්‍රගතිය පලාත් අධ්‍යක්ෂ මගින් ප්‍රධාන කාර්යාලයට වාර්තා කිරීම
3. ව්‍යාපෘතියේ කටයුතු නිසිලෙස පවත්වාගෙන යාමට අදාලව අනෙකුත් වාර්තා පවත්වාගෙන යාම
4. හිමිකම් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලියකියවිලි වල නිරවද්‍යතාවය තහවුරු කිරීම

පළාත් අධ්‍යක්ෂ

1. අදාළ ගොවිපොල, අදාළ ශිල්පීන්ගේ සහ නිළධාරීන්ගේ කටයුතු නිසි ලෙස අධීක්ෂණය කිරීම
2. මූල්‍ය කළමණාකරණය
3. ව්‍යාපෘතියේ කටයුතු නිසි ලෙස පවත්වා ගැනීමට අදාළ වාර්තා මැනවින් පවත්වා ගැනීම සහ
4. සුදුසු වෙනත් අධීක්ෂණ කටයුතු ක්‍රියාත්මක කරවීම

රජයේ නිළධාරීන් සඳහා පහත සඳහන් පරිදි ගමන් වියදම් ගෙවීමට කටයුතු කරනු ලැබේ.

- සත්ව සංවර්ධන උපදේශකවරුන් සඳහා - සතුන් 1-5 දක්වා මාස 3 කට වරු 01ක්
- පශු වෛද්‍ය නිළධාරීන් සඳහා - සතුන් 1-5 දක්වා මාස 6 කට වරු 01ක්
- දිස්ත්‍රික් පශු වෛද්‍ය නිළධාරීන් සඳහා - සතුන් 1-4 දක්වා මාස 6 කට වරු 01ක්
- පළාත් මට්ටමේ අධීක්ෂණය සඳහා - මාසයකට දින 04 කි

පෞද්ගලික කෘත්‍රිම සිංචන ශිල්පීන් සඳහා එක් සතෙකුට මාස 03 කට වරක් රු:50.00 ක අධීක්ෂණ දීමනාවක් ගෙවනු ලැබේ.

ඉන්ධන

➢ සත්ව සංවර්ධන උපදේශකවරුන් සඳහා	-	එක් සතෙකුට මාස 3 කට වරක් කිලෝ මීටර 20ක් වෙනුවෙන් යතුරුපැදි සඳහා ඉන්ධන වියදම ප්‍රතිපූර්ණය
➢ පශු වෛද්‍ය නිළධාරීන් සඳහා	-	පරීක්ෂා කරන සතුන් පස් දෙනෙකු (5) වෙනුවෙන් මසකට රු. 500.00
➢ දිස්ත්‍රික් පශු වෛද්‍ය නිළධාරීන් සඳහා	-	පරීක්ෂා කරන සතුන් පස් දෙනෙකු (5) වෙනුවෙන් මසකට රු. 500.00
➢ පළාත් අධ්‍යක්ෂවරුන් සඳහා	-	මසකට රු. 5000.00ක ඉන්ධන ප්‍රතිපාදන සලසනු ලැබේ

පළාත් අධ්‍යක්ෂවරුන් වෙත ඉන්ධන ගමන් වියදම් සහ ගොවි ප්‍රතිලාභ සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන සීමාව තුළ එක් එක් කාර්යය වෙනුවෙන් එක් වරකට රු. 100,000.00 ක විශේෂ-අත්තිකාරම් මුදලක් ලබා ගෙන ඉහත පරිදි වියදම් දරා අක් මුදල ප්‍රතිපූර්ණය කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල්
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

වෛද්‍ය ඩබ්. කේ. ද සිල්වා
අධ්‍යක්ෂ ජනරාල්
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව